# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1558 / 2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2023

දිනය
திகதி
Date — 11/12/2023
පැය 1310

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. අපරාධයක් සඳහා සූදානමින් සිටි බවට සැකකෙරෙන පුද්ගලයින් පස්දෙනෙකු හා සැකකාරියක් හෙරොයින් සහ ව්‍යාජ පිස්තෝල අවියක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ශ්‍රී ජයවර්ධනපුර කඳවුර.**

2023.12.09 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සේදවත්ත, අඹතලේ මාර්ගයේ නව කැළණිය ගුවන් පාලම ආසන්නයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ශ්‍රී ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් විසින් සැකකටයුතු යතුරු පැදි දෙකක් නවතා පරීක්ෂා කිරීමේදී එම යතුරු පැදි දෙකෙහි පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු සන්තකයේ තිබී **හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 370 ක් සහ ව්‍යාජ පිස්තෝල අවියක් සොයාගෙන** ඇති අතර සැකකරුවන් යතුරුපැදි දෙකද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන්ගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී, ඔවුන්ගෙන් ලද තොරතුරුවලට අනුව නාගලගම් වීදිය ප්‍රදේශයේදී ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු හා සැකකාරියක් සන්තකයේ **තිබී හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 497 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර හෙරොයින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැක කරන රුපියල් 9,890,000/- ක් මුදලක්** සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26, 29, 30, 43 හා 41 වයස්වල පසුවන කල්එළිය, සේදවත්ත, උස්වැටකෙයියාව හා රත්මලාන ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 27 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකරුවන්ගෙන් සිදුකළ ප්‍රශ්න කිරීමේදී, මෙම කණ්ඩායම යම් අපරාධයක් සඳහා සූදානමින් සිටියදී මෙලෙස අත්අඩංගුවට පත්ව ඇති බවට අනාවරණය වී ඇත.

සැකකරුවන් හා සැකකාරිය ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති අතර ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. වෙඩි වැදී පුද්ගලයෙකු තුවාල ලැබීමක් - සූරියපුර පොලිස් වසම.**

2023.12.10 වන දින දහවල් කාලයේ සූරියපුර පොලිස් වසමේ දිවුල්වැව ප්‍රදේශයේ දී පුද්ගලයෙකු වෙඩි වැදී තුවාල ලබා ප්‍රතිකාර සඳහා කන්තලේ රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා පොලොන්නරුව මහ රෝහල වෙත මාරුකර යවා ඇති බවට කන්තලේ රෝහල් පොලීසිය මඟින් සූරියපුර පොලිසියට ලැබුණු දුරකථන පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 58 ක් වන වාන්ඇල, කන්තලේ ප්‍රදේශයේ පදිංචි සිවිල් ආරක්ෂක බලකායට අනුයුක්ත රාජකාරි කරනු ලබයි.**

තුවාලකරු තම රැකියාවට අමතරව දිවුල්වැව ප්‍රදේශයේ ගව පාලනය සිදුකරන බවත්, සෑම දිනකම ගවයින් රැකබලා ගැනීම සඳහා එම ප්‍රදේශයට නිවසින් පිටව යන බවත්, එලෙස ගවයින් රැකබලා ගැනීම සඳහා පිටව ගොස් සිටිය දී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් ක්‍රියාත්මක වීමෙන් තුවාල සිදුව ඇති බවට විමර්ශනයේදි අනාවරණ වී ඇත.

සූරියපුර  පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. තීරුබදු රහිතව මෙරටට ආනයන කරන ලද දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගුවන් තොටුපොල පොලිස් වසම.**

2023.12.11 වන අද දින අළුයම් කාලයේ ගුවන් මගින් මෙරටට පැමිණි ගුවන් මඟියෙකු සන්තකයේ තීරුබදු නොගෙවා මෙරටට ආනයන කරන ලද දුම්වැටි තොගයක් ඇති බවට ගුවන්තොටුපොල පොලිස් ස්ථානයට ලද තොරතුරක් අනුව ගුවන් තොටුපොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දුම්වැටි 22800 ක් අඩංගු සිගරට් බන්ඩල් 114 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන වහුගපිටිය, පුස්සැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගුවන් තොටුපොල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**